# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,153—1960 ජූලි 1 වැනි සිකුරාදා—1.7.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන | ... | | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් | ... | | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | | 745 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | | 745 |
| වෙනත් පත් කිරීම් ... | ... | ... | 746 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | | — | — |
| ආණ්ඩුවේ නිවේදන | ... | — | 747 |
| මිල පාලන දැන්වීම් ... | ... | — | 748 |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා | ... | ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | | — | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | ... | — | 749 |
| "ගුරුබඳු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... | | — | — |


## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 259**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියමකර ඇත්තේය :—

**ඒ. 205/60.**

1960 මැයි මස 30 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අධ්‍යක්ෂ ඇස්. ඇෆ්. ද සිල්වා මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව රජයේ ලලිත කලායතනයේ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

**ඒ. 175/60.**

1960 මැයි මස 15 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ආණ්ඩුවේ ඛනිජ විද්‍යාඥ ඇල්. ජේ. ඩී. ප්‍රනාන්දු මහතා සවකීය රාජකාරිවලට අතිරේකව කම්මාන්ත අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

**ඒ. 164/60.**

1960 මැයි මස 29 වැනි දින සිට 1960 ජූනි මස 12 වැනි දින දක්වා හෝ නැවත නියමයක් කරන තුරු කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය, භාර ආණ්ඩුවේ ඒජන්ත ජේ. වී පොන්සේකා මහතා (සී. සී. ඇස්.) සවකීය රාජකාරිවලට අතිරේකව පුත්තලම පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත වශයෙන් වැඩ බැලීමට.

**ඒ. 333/59.**

1959 දෙසැම්බර් මස 18 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු ඇස්. සී. ඉන්තිරන් මහතා එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු තනතුරෙහි රාජකාරිවල කටයුතු කිරීමට.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූනි මස 27 වැනි දින,
තැ. පෙ. 500,
කොළඹ 1, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දීය.

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 260**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

**අංකය : ජේඒ. 7/48.**

වී. එස්. ගුණවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1960 ජූනි 29 වැනි දින සිට, බලපිටියේ මහේස්ත්‍රාත් උසාවියේ අංක 25,904 නඩුව අවසාන වනතුරු ඇසීමට හා තීන්දුව දීමට, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

**අංකය : ජේඑල්. 8බී/57.**

බී. ඊ. ද සිල්වා මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1960 ජූනි 20 වැනි දින සිට, හලාවත, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

**අංකය : ජේඑල්. 56ඒ/57.**

ඊ. එස්. සාලි මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, පී. පී. සී. කැරන් මහතා 1960 ජූනි 17 වැනි දින සිට, මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මීගමුවේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා මීගමුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

**අංකය : ජේඑල්. 9ඒ/52.**

ඊ. ඕ. එෆ්. ද සිල්වා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එන්. බී. ද එස්. විජේසේකර මහතා 1960 ජූලි 13 වැනි දින, කළුතර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 23ඒ/58.

ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. යටවර මහතා 1960 ජූලි 2 වැනි දින සිට 6 වැනි දින දක්වා, මහනුවර, ගම්පොල පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 26/50.

ඒ. ඕ. ජේ. ගුණවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා 1960 ජූනි 24 වැනි දින, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 67ඒ/58.

ඩබ්ලිව්. ඕ. තාමෝතරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඉලෙයතම්බි මහතා 1960 ජූනි 27 වැනි දින සිට 1960 ජූලි 1 වැනි දින දක්වා, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපනේ, මල්ලාකම් පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 4/48.

ජී. ඊ. අමරසිංහ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 ජූනි 25 වැනි දින, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/පී. 1/48.

ආර්. පරමකුරු මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1960 ජූනි 26 වැනි දින සිට, මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්/පී. 1/48(ඒ).

ආර්. පරමකුරු මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. එස්. පෝල් මහතා 1960 ජූනි 28 වැනි දින සිට 30 වැනි දින දක්වා, මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 4/53.

එෆ්. ජේ. සී. අබේකෝන් මහතා නැති අතර, කේ. පී. ගුණරත්න මහතා 1960 ජූනි 20 වැනි දින, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා බස්නාහිර පස්දුන් කෝරලයන්හි හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 1/50.

වී. නල්ලසේගරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආර්. රාජේන්ද්‍රා මහතා 1960 ජූනි 18 වැනි හා 20 වැනි දිනයන්හි, යාපන දිස්ත්‍රික්කයේ උතුරු හා නැගෙනහිර වලිකාමම්, වඩමරච්චි හා යාපනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 4/53.

එෆ්. ජේ. සී. අබේකෝන් මහතා නැති අතර, එච්. එස්. අගලවත්ත මහතා 1960 ජූනි 30 වැනි දින, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා බස්නාහිර පස්දුන් කෝරලයන්හි හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පරනාදන් මහතා නැති අතර, වී. ආර්. සත්චිත්තානන්දන් මහතා 1960 ජූලි 11 වැනි දින, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තු ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූනි මස 23 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

## 1960 අංක 261

අංකය : ඒ. ජේ. 28/1/56.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

ජේ. පී. කරුණාතිලක මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු ලෙස පත් කර ඇත්තේ ය.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1960 ජූනි මස 15 වෙනි දින සිට ඕ. බී. බෝයෙගොඩ මහතා නැවත වැඩ භාරගන්නාතුරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ 'කෝරලේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ඕ. එම්. ඩිංගිරි බණ්ඩා මහතාද,

1960 ජූනි මස 22 වෙනි දින සිට පී. එල්. පැට්රික් මහතා නැවත වැඩ භාරගන්නාතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ අක්කරෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට බී. ඒ. ජේ. කාසිනඩර් මහතාද

පත් කර ඇත්තේ ය.-

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
සථිර ලේකම්.

1960 ජූනි මස 27 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

---

## 1960 අංක 262

ඩන්ස්ටන් ඔස්වල්ඩ් ආදිහෙට්ටි මහතා කොළඹ අධිකරණ කොඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූනි මස 16 වැනි දින,
කොළඹ දිය.

---

## 1960 අංක 263

තියාගරාජා වන්නියසිංකම් මහතා, කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත් කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූනි මස 20 වැනි දින,
කොළඹ දීය.

---

## 1960 අංක 264

තියබෝල්ඩ් වින්සන්ට් කන්නන්ගර මහතා පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූනි මස 17 වැනි දින,
කොළඹ දීය.

---

## 1960 අංක 265

දෙන් රූපට් සමරසේකර මහතා කළුතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත් කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
සවදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූනි මස 13 වැනි දින,
කොළඹ දීය.

**1960 අංක 266**

ගුස්තින්න ලියන හේමදාස ධම්මවංශ මහතා බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූනි මස 22 වැනි දින,
කොළඹ දීය.

---

**1960 අංක 267**

ලොකුගන්හේවගේ ලෙස්ලි ගුණතිලක මහතා මාතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

---

**1960 අංක 268**

සයිතුන් අබ්දුල් හමීඩ් මහතා ත්‍රිකුණාමලය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූනි මස 20 වැනි දින,
කොළඹ දීය.

---

**1960 අංක 269**

මුරුගුපිල්ලේ කෝනාමලෙයි සෙල්ලරාජා මහතා ත්‍රිකුණාමලය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදෙශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූනි මස 13 වැනි දින,
කොළඹ දී ය.

---

**1960 අංක 270**

ලූවී සෙබස්තියන් පොන්රාජා මහතා බදුල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත් කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

---

**1960 අංක 271**

එඩ්වර්ඩ් ගොඩ්ෆ්‍රි බොනිෆස් පෙරේරා මහතා, කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත්කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූනි මස 20 වැනි දින,
කොළඹ දීය.

---

## ආණ්ඩුවේ නිවේදන

මීගමුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් කැමිලස් රුද්‍රිගු මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1960 ජූනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

---

### 1952කෝ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පනත

**උතුරු කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලය**

1952 කෝ අංක 12 දරණ සෞඛ්‍ය සේවා පනතෙහි 11 වෙනි වගන්තිය යටතේ 1960 ජූනි 20 වෙනි දින පටන් 1961 ජූනි 9 වෙනි දින දක්වා ලොයිඩ් වෙත්තසිංහ මහතා උතුරු කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලයේ සාමාජිකයෙකු මෙන් ගරු සෞඛ්‍ය සහ සමාජසේවා ඇමතිතුමා විසින් පත්කරනු ලැබී ය.

වි. ජේ. ඇ. වැන් ලැන්ගන්බර්ග්,
ස්ථාවර ලේකම්.

1960 ජූනි 20 වෙනි දින,
කොළඹ, සෞඛ්‍ය සහ සමාජසේවා අමාත්‍යාංශයේ දී ය.

---

ඇල්.ඩී.—බී. 207/41.

### 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥා පනත

**6 (2) වන වගන්තිය යටතේ නිවේදනයයි**

වෂී 1943 අංක 40 දරණ ආඥා පනතින් සංශොධිත 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥා පනතේ 6(1) වන වගන්තිය යටතේ අයිස් සහ සිසිල් බීම සෑදීමේ කර්මාන්තයට අදාල මෙහි පහත දක්වෙන නියෝගය මා විසින් පනවන ලද බව එකී 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥා පනතේ 6(2) වන වගන්තියේ විධි විධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ නියෝගය වෂී 1960 අගෝස්තු මස 1 (පළවෙනි) වැනි දින වලංගු බවට පැමිණේ.

බී. එච්. අලුවිහාරේ,
කම්කරු, කර්මාන්ත සහ ධීවර කටයුතු
පිළිබඳ ඇමති.

1960 ජූනි මස 22 වැනි දින,
කොළඹ දීය.

**නියෝගය**

වෂී 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥාපනතේ II වන කොටසේ විධි විධාන මෙහි පහත සඳහන් කර්මාන්තයට අදාල විය යුතුය :—

අයිස් සහ සිසිල් බීම සෑදීමේ කර්මාන්තය, එනම්—

සිසිල් බීම, අමද්‍යපාන වගී, රසමුසු සිරප් වගී, නොපැසු පැනිරස බීම, ඔසුමුසු බීම සහ අයිස් සෑදීම;

පහත දක්වෙන වැඩ ද ඊට ඇතුළත් වේ—

(1) බෝතල සේදීමේ කටයුතු ;

(2) සිරප් පිළියෙල කිරීම ;

(3) බෝතල් කිරීම, පිරවීම, ඇබ ගැසීම සහ ලේබල් ගැසීම ;

(4) නිෂ්පාදනයට පෙර සහ පසුව බෝතල ඇල්ලීම ;

(5) ඉහත සඳහන් කවර බීම වගීයක් වුවත් බෝතලවල හෝ වෙනත් භාජනවල පුරවා විකිණීමට සූදානම් කිරීම වශයෙන් කෙරෙන සියලුම කටයුතු ;

(6) අයිස් සෑදීම සම්බන්ධ සියලුම කටයුතු ;

(7) ඉහතකී බීම වගී සහ අයිස් ඒවා සාදන ස්ථානයේ දී විකිණීම පිළිබඳ කටයුතු ; සහ

(8) ඉහතකී බීම වගී සහ අයිස් ගෙන යෑම, බාරදීම සහ (ඒවා සාදන ස්ථානයේ දි හැර) විකිණීම පිළිබඳ වැඩ කටයුතු සහ එවැනි බීම වර්ග සහ අයිස් සාදන ව්‍යාපාරයේ සේවයෙහි නියුක්ත අය විසින්ම කරන විට හිස් බෝතල් එකතු කිරීම.

එහෙත් පහත සඳහන් කම්කරුවන්ගේ වැඩ ඇතුළත් නො වන්නේ ය :—

(1) ලිපිකරුවෝ, කෑෂියර්වරු, ගබඩාකරුවෝ; වේලා සටහන් කරුවෝ, ඕවර්සියර්වරු, මුරකරුවෝ සහ බලාගන්නෝ ;

(2) වෂී 1945 නොවැම්බර් මස 2 වන දින අංක 9,481 දරණ ගැසට් පත්‍රයේ පළවූ නියෝගයෙහි නියමිත මෝටර් රථ ගමනාගමන කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන් ; සහ

(3) වෂී 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරණ ගැසට් පත්‍රයේ පළ වූ සහ අනතුරුව සංශෝධනය කරන ලද පරිද්දෙන් ගතයුතු නියෝගයෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ.

## කම්කරු පඩි සභා ආඥාපනත

ගිනිපෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ බී. ඒ. තෝර්ස්ටෙන්සන් මහතා වෙනුවට එම කම්කරු පඩි සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකුව පෙනී සිටීමට වර්‍ෂ 1943 අංක 40 දරණ කම්කරු පඩි සභා (සංශෝධන) ආඥා පනතින් සහ වර්‍ෂ 1953 අංක 5 දරණ කම්කරු පඩි සභා (සංශෝධන) පනතින් සංශෝධිත වර්‍ෂ 1941 අංක 27 දරණ කම්කරු පඩි සභා ආඥා පනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු, ධීවර හා කර්මාන්ත ඇමතිතුමන් විසින් වයි. එච්. එක්මාර්ක් මහතා පත් කරන ලද බව වර්‍ෂ 1943 කම්කරු පඩි සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
වැ. බ. සථිර ලේකම්වරයා,
කම්කරු, ධීවර හා කර්මාන්ත අමාත්‍යාංශය.

1960 ජූනි මස 23 වැනි දින,
කොළඹ දීය.

---

## කම්කරු පඩි සභා ආඥාපනත

මෝටර් රථ ගමනාගමන කර්මාන්තය පිළිබඳ කම්කරු පඩි සභාවේ සාමාජිකයෙකුව සිට ඉල්ලා අස්වූ පී. කාසිලිංගම් මහතා වෙනුවට, එම කම්කරු පඩි සභාවේ නම් නියමකොට පත් කරන ලද සාමාජිකයෙකුව පෙනී සිටීමට වර්‍ෂ 1943 අංක 40 දරණ කම්කරු පඩි සභා (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත වර්‍ෂ 1941 අංක 27 දරණ කම්කරු පඩි සභා ආඥා පනතේ 9 වන වගන්තිය යටතේ, ගරු කම්කරු, කර්මාන්ත හා ධීවර ඇමතිතුමන් විසින් ඇස්. ඇස්. එච්. සිල්වා මහතා පත් කරන ලද බව වර්‍ෂ 1943 කම්කරු පඩි සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
වැ. බ. සථිර ලේකම්වරයා,
කම්කරු, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශය.

1960 ජූනි මස 23 වැනි දින,
කොළඹ දීය.

---

# මිල පාලන දැන්වීම්

**පී.එල්. 8/60 වෙනි අංකය දරණ ආහාර මිල නියෝගය.**

**සහල් (තොග සහ සිල්ලර)**

## 1950 අංක 29 දරණ මිල පාලන පනත

### නියෝගය

පොළොන්නරුව පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක නැන්පත් චාර්ල්ස් අබේදීර වන මම, 1950 අංක 29 දරණ මිල පාලන පනතෙහි 3(2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1960 අප්‍රේල් මස 11 වැනි දින, අංක 12,105 දරණ ලංකාණ්ඩුවේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක පී.එල්. 5/60 සහ 1960 අප්‍රේල් මස 8 වැනි දින දරණ ආහාර මිල නියෝගය 1960 ජූනි මස 22 වැනි දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් පෙදෙස්වල වෙළඳාම කරගෙන යන ආහාර පාලනය සඳහා පත් කරනු ලැබූ බලයලත් වෙළඳුන්ට නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙදාහරින සහල් තොග වශයෙන් ශුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණීමේ වැඩිම මිල මේ දැන් පටන් එම උප ලේඛනයේ 2 වැනි තීරයේ අනු පිළිවෙලින් සඳහන් මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් පෙදෙස්වල නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙදා හරින සහල් වලින් ශුද්ධ කිරුමෙන් රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිල මේ දැන් පටන් එම උප ලේඛනයේ 3 වැනි තීරයේ අනු පිළිවෙලින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයෙහි කාර්ය සඳහා—

(අ) මොනම සහල් ප්‍රමාණයක් වුවත් යලින් විකිණීමක් වුවහොත් ඒ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) මොනම සහල් ප්‍රමාණයක් වුවත් පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස විකිණීමක් වුවහොත් එම විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස ගණන් ගත යුතු බවත්,

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම සහල් ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිල බවත්,

(ඈ) රාත්තල හෝ "රා." යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපෝයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද,

(ඉ) නියමිත සහල් ප්‍රමාණය යන්නෙන් හැඟවෙන්නේ ආහාර පාලන පනත සහ එහි යටතේ සකස් කරණ ලද රෙගුලාසි අනුව එවෙලෙට දිය යුතු සහල් ප්‍රමාණය බව මෙයින් නියෝග කරමි.

(5) එසේම මෙම නියෝගයෙහි සඳහන් සහල් විකිණිය හැකි වැඩිම මිල බලපවත්නා සෑම පෙදෙසකම වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් සහල් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියමකරණු ලැබූ සෑම පෙදෙසකම යම් ස්ථානයක හෝ වාහනයක සහල් සිය ස්වාමීත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඒ සහල් වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ සහල් වල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිල උසින් අඟලකට අඩු නොවූ ඉලක්කම් වලින් මිල පුවරුවක ලියා එම පුවරුව එම භාජනයට ඇදා එම සහල් සහ මිල පුවරුවද ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙණෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙම නියෝගයෙන් නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල නියම කරණු ලැබූ සෑම පෙදෙසකම සහල් තොග වශයෙන් විකුණනු ලබන සෑම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණනු ලබන සෑම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බව ද මෙයින් නියම කරමි.

(8) සහල් විකිණීමේ දී එය යම්කිසි දෙයක ඔතනු ලැබුයේ නම් හෝ බහා දෙනු ලැබුයේ නම් හෝ එහි මිළද මේ නියෝගයෙන් නියමිත වැඩිම මිල ගණන්වලට ඇතුළත් වී ඇති බවද මෙයින් නියම කරමි.

පොළොන්නරුවේ කච්චේරියේ දී 1960 ජූනි 22 වැනි දින, පෙරවරු 10 ට අත්සන් තබන ලදී.

සී. අබේදීර,
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර
මිල (ආහාර) පාලක තැන.

## උපලේඛනය

| 1 වැනි තීරය | | 2 වැනි තීරය | | 3 වැනි තීරය |
|---|---|---|---|---|
| ප්‍රදේශය | | නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙද හරින සහල් වලින් ශුද්ධ කිරුමෙන් හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම තොග මිල | | නියමිත සහල් ප්‍රමාණය සඳහා බෙද හරින සහල් වලින් ශුද්ධ කිරුමෙන් රාත්තලක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිල |
| | | රු. ශ. | | රු. ශ. |
| සිංහල පත්තුව | ... | 14 43½ | ... | 0 14 |
| මැද පත්තුව | ... | 14 58½ | ... | 0 14 |
| එගොඩ පත්තුව | ... | 14 75½ | ... | 0 15 |

**සැලකිය යුතුයි.**—මේ මිල ගණන් සහල් විකිණීමේ නියමිත මිල නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිල ගණන්ය. මේ මිල ගණන්වලට ඉහලින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැකිසි.

# විවිධ දෙපාර්තමේන්තු දන්වීම්

## කලුතර දිස්ත්‍රික්කයේ 1959/60 යන වර්ෂවල දී ගවයින් හංවඩු ගැසීම සම්බන්ධ වැඩ සටහන

වර්ෂ 1943ක්වූ ඔක්තෝබර් මස 15 වෙනි දින පළවුණු අංක 9,181 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හංවඩු ගැසීම පිළිබඳ නීති මාලාවේ 3(3) වගන්තිය අනුව කලුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළයේ ගවයින් හංවඩු ගැසීමේ වැඩ සටහන මහජනයාගේ දනගැනීම පිණිස මෙහි පහත ප්‍රසිද්ධ කරණු ලැබේ.

වර්ෂ 1960ක්වූ ජූනි මස 20 වෙනි දින,
කලුතර කච්චේරියේදීය.

වී. පතිරණ,
කලුතර දිසාපති තැන.

### 1959/60 අවුරුද්දේ නැගෙනහිර පස්දුන් කෝරළයේ ගවයින් නිවරණය කිරීම පිළිබඳ කාල සටහණ

| ගම් මුලාදැනි කොට්ඨාශ අංක හා කොට්ඨාශ | නාම | නිවරනය කරණ ස්ථාන | නිවරණය කරණ දින |
|---|---|---|---|
| 811. | කරන්නාගොඩ | ගම්මුලාදැනිතැනගේ නිවස පිහිටි ඉඩම | 1960 අගෝස්තු 1 සහ 2 |
| 812. | දේවමුල්ල | එම | 1960 අගෝස්තු 4 සහ 5 |
| 813. | කොබවක | එම | 1960 අගෝස්තු 8 සහ 9 |
| 814. | ගෝවින්න | එම | 1960 අගෝස්තු 11 සහ 12 |
| 815. | නාහල්ල | එම | 1960 අගෝස්තු 15 සහ 16 |
| 816. | වරකාගොඩ | වරකාගොඩ මංසන්ධිය අසල | 1960 අගෝස්තු 18 සහ 19 |
| 817. | කුඩලිගම | ගම් මුලාදැනිතැනගේ නිවස පිහිටි ඉඩම | 1960 අගෝස්තු 23 සහ 24 |
| 818. | වෙයංගල්ල | එම | 1960 අගෝස්තු 26 සහ 27 |
| 819. | මහගම උතුර | එම | 1960 අගෝස්තු 1 සහ 2 |
| 819.ඒ. | මහගම දකුණ | එම | 1960 අගෝස්තු 4 සහ 5 |
| 820. | දියකඩුව | එම | 1960 අගෝස්තු 8 සහ 9 |
| 821. | බුලත්සිංහල | එම | 1960 අගෝස්තු 11 සහ 12 |
| 821ඒ. | දෙල්මැල්ල | එම | 1960 අගෝස්තු 15 සහ 16 |
| 822. | බෝතලේ | එම | 1960 අගෝස්තු 18 සහ 19 |
| 822ඒ. | හල්වතුර | එම | 1960 අගෝස්තු 23 සහ 24 |
| 823. | යවගම්පිටිය | එම | 1960 අගෝස්තු 26 සහ 27 |
| 824. | වෙල්ගම | එම | 1960 සැප්තැම්බර් 1 සහ 2 |
| 825. | මෝල්කාව | එම | 1960 සැප්තැම්බර් 6 සහ 7 |
| 826. | ඕමත්ත | එම | 1960 අගෝස්තු 1 සහ 2 |
| 827. | පිඹුර | එම | 1960 අගෝස්තු 4 සහ 5 |
| 828. | උඩවෙල | එම | 1960 අගෝස්තු 8 සහ 9 |
| 829. | අගලවත්ත | එම | 1960 අගෝස්තු 11 සහ 12 |
| 830. | වඳුරඹබ | පින්නගොඩ ගම්මුලාදැනි තැනගේ නිවස පිහිටි ඉඩම | 1960 අගෝස්තු 15 සහ 16 |
| 832. | පින්නගොඩ | ගම් මුලාදැනිතැනගේ නිවස පිහිටි ඉඩම | 1960 අගෝස්තු 18 සහ 19 |
| 833. | කිතුල්ගොඩ | එම | 1960 අගෝස්තු 23 සහ 24 |
| 834. | බෙල්ලන | එම | 1960 අගෝස්තු 26 සහ 27 |
| 835. | ලත්පඳුර | ලත්පඳුර මංසන්ධිය අසල | 1960 අගෝස්තු 1 සහ 2 |
| 836. | පැලැඳ | ගම්මුලාදැනි තැනගේ නිවස පිහිටි ඉඩම | 1960 අගෝස්තු 4 සහ 5 |
| 836ඒ. | මොරපිටිය | එම | 1960 අගෝස්තු 8 සහ 9 |
| 837. | මීදලන | එම | 1960 අගෝස්තු 11 සහ 12 |
| 838. | හැඩිගල්ල | එම | 1960 අගෝස්තු 15 සහ 16 |
| 839. | බදුරලිය | එම | 1960 අගෝස්තු 18 සහ 19 |
| 840. | කළුගල සහ පැණිගල | එම | 1960 අගෝස්තු 23 සහ 24 |
| 841. | අතලේ | එම | 1960 සැප්තැම්බර් 1 සහ 2 |
| 842. | බොරළුගොඩ | එම | 1960 සැප්තැම්බර් 6 සහ 7 |
| 843. | ඉහල හෙවෙස්ස | එම | 1960 අගෝස්තු 1 සහ 2 |
| 843ඒ. | පහල හෙවෙස්ස | එම | 1960 අගෝස්තු 4 සහ 5 |
| 844. | රත්මලේ | එම | 1960 අගෝස්තු 8 සහ 9 |
| 845. | කුරුපිට | එම | 1960 අගෝස්තු 11 සහ 12 |
| 846. | කෙවිටියගල | එම | 1960 අගෝස්තු 15 සහ 16 |
| 847. | කළුපහණ | එම | 1960 අගෝස්තු 18 සහ 19 |
| 848. | මොරගල | එම | 1960 අගෝස්තු 23 සහ 24 |
| 849. | මීගහතැන්න | එම | 1960 අගෝස්තු 26 සහ 27 |
| 850. | පැලවත්ත | එම | 1960 සැප්තැම්බර් 1 සහ 2 |

---

## කළුතර දිස්ත්‍රික්කයේ 1959/60 යන වර්ෂවලදී ගවයින් හංවඩු ගැසීම සම්බන්ධ වැඩ සටහන

වර්ෂ 1943ක් වූ ඔක්තෝබර් මස 15 වෙනි දින පළවුණු අංක 9,181 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ගවයින් හංවඩු ගැසීම පිළිබඳ නීති මාලාවේ 3(3) වගන්තිය අනුව කලුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ගවයින් හංවඩු ගැසීමේ වැඩ සටහණ මහජනයාගේ දැනගැනීම පිණිස මෙහි පහත ප්‍රසිද්ධ කරණු ලැබේ

වර්ෂ 1960ක්වූ ජූනි මස 23 වෙනි දින,
කලුතර කච්චේරියේදී ය

වී පතිරණ,
කලුතර දිසාපති තැන.

### කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ 1960 වර්ෂයේදී ගවයින් නොම්මර කිරීම සම්බන්ධ වැඩ සටහන

| ගම් මුලාදැනි අංකය සහ | කොට්ඨාශය | නොම්මර කරන ස්ථානය | නොම්මර කරන දිනය |
|---|---|---|---|
| 604. | ජල්ලන්නොරුව | ගම් මුලාදැනි තැනගේ නිවෙස | 1. 8.60— 2. 8.60 |
| 605. | ඔලබොඩුව | එම | 4. 8.60— 5. 8.60 |
| 606. | ගොඩිගමුව | එම | 8. 8.60— 9. 8.60 |
| 607. | කුඹුකෙ | එම | 10. 8.60—11. 8.60 |
| 608. | පොකුණුවිට | එම | 14. 8.60—15. 8.60 |
| 609. | කනේවල | එම | 19. 8.60—20. 8.60 |
| 610. | කුළුපන | එම | 23. 8.60—24. 8.60 |
| 611. | බටුවිට | එම | 27. 8.60—28. 8.60 |
| 612. | කහටපිටිය | එම | 30. 8.60—31. 8.60 |

| ගම්මුලාදෑනි අංකය සහ කොට්ඨාශය | නොම්මර කරන ස්ථානය | නොම්මර කරන දිනය |
|---|---|---|
| 613. තලගල | ගම්මුලාදෑනි තැනගේ නිවස | 2. 9.60— 3. 9.60 |
| 614. උඩුව | එම | 1. 8.60— 2. 8.60 |
| 615. හොරණ | එම | 4. 8.60— 5. 8.60 |
| 616. මුණගම | එම | 8. 8.60— 9. 8.60 |
| 632. කදන | එම | 10. 8.60—11. 8.60 |
| 633. බෙරවත්ත | වෙල් මුලාදෑනි තැනගේ නිවෙස | 14. 8.60—15. 8.60 |
| 634. යාල | ගම් මුලාදෑනි තැනගේ නිවෙස | 19. 8.60—20. 8.60 |
| 650. රෙමුණ | එම | 23. 8.60—24. 8.60 |
| 637. මදුරාවල | එම | 27. 8.60—28. 8.60 |
| 648. කෙසෙල්හේනාව | එම | 30. 8.60—31. 8.60 |
| 617. මීවනපලාන | එම | 1. 8.60— 2. 8.60 |
| 617. ඒ.ගුරුගොඩ | එම | 4. 8.60— 5. 8.60 |
| 618. වගවත්ත | හිටපු ගම්මුලාදෑනි තැන වූ ඩී. ඇල්. දිසාපාල මහතාගේ නිවෙස | 8. 8.60— 9. 8.60 |
| 619. ඌරුගල | ගම් මුලාදෑනි තැනගේ නිවෙස | 10. 8.60—11. 8.60 |
| 620. ඉංගිරිය | එම | 14. 8.60—15. 8.60 |
| 622. මාපුටුගල | එම | 17. 8.60—18. 8.60 |
| 624. හඳපාන්ගොඩ | එම | 19. 8.60—20. 8.60 |
| 626. කඳනපිටිය | එම | 24. 8.60—25. 8.60 |
| 627. අරකාවිල | එම | 27. 8.60—28. 8.60 |
| 628. මිල්ලෑව | එම | 30. 8.60—31. 8.60 |
| 629. කිඳෙල්පිටිය | එම | 2. 9.60— 3. 9.60 |
| 630. දඹර | එම | 6. 9.60— 7. 9.60 |
| 631. හාන්දුපැල්පොල | එම | 10. 9.60—11. 9.60 |
| 638. උඩුවර | වෙල් මුලාදෑනි තැනගේ නිවස | 1. 8.60— 2. 8.60 |
| 639. පාතකඩ | ගම්මුලාදෑනි තැනගේ නිවස | 4. 8.60— 5. 8.60 |
| 640. යටවර | එම | 8. 8.60— 9. 8.60 |
| 642. ගල්පාත | එම | 10. 8.60—11. 8.60 |
| 643. පැල්පොල | එම | 14. 8.60—15. 8.60 |
| 644. පරගස්තොට | එම | 17. 8.60—18. 8.60 |
| 645. මිල්ලනිය | එම | 19. 8.60—20. 8.60 |
| 646. ලහාන | එම | 24. 8.60—25. 8.60 |
| 647. හල්කොට | එම | 27. 8.60—28. 8.60 |
| 652. කැන්නන්තුඩාව | එම | 30. 8.60—31. 8.60 |
| 653. යටගල | එම | 2. 9.60— 3. 9.60 |
| 654. වැලිකල | එම | 6. 9.60— 7. 9.60 |
| 655. ගුංගොමුව | එම | 10. 9.60—11. 9.60 |
| 656. රයිගම | එම | 1. 8.60— 2. 8.60 |
| 657. පනාපේ | එම | 4. 8.60— 5. 8.60 |
| 659. අවුලුගම | එම | 8. 8.60— 9. 8.60 |
| 660. බමුණුමුල්ල | එම | 10. 8.60—11. 8.60 |
| 662. වැව්ට | කේ. චන්ද්‍රසේන මහතා පදිංචි වැව්ට, පැලවත්ත නැමති ඉඩම | 14. 8.60—15. 8.60 |
| 661. ගැලනිගම | ගම්මුලාදෑනි තැනගේ නිවස | 17. 8.60—18. 8.60 |
| 666. කඹුරුගොඩ | එම | 24. 8.60—25. 8.60 |
| 664. විදගම | එම | 27. 8.60—28. 8.60 |
| 665. රමුක්කන | එම | 30. 8.60—31. 8.60 |
| 667. ගම්මන්පිල | එම | 2. 9.60— 3. 9.60 |
| 668. අළුත්ගම | එම | 6. 9.60— 7. 9.60 |
| 669. කිඳෙල්පිටිය | එම | 10. 9.60—11. 9.60 |

## 1952 තිස්සමහාරාම වන් දනා රෙගුලාසි

වර්ෂ 1952 ප්‍රකාශයට පමුණුවන ලද තිස්සමහාරාම වන් දනා රෙගුලාසිවල අංක 3 දරණ රෙගුලාසිය අනුව හම්බන්තොට වැඩ බලන දිසාපති තැන් පත් ටී. සිවඥනම් වන මම පහත සඳහන් දිනයන් 1952 තිස් සමහාරාම වන් දනා රෙගුලාසි බල පවත් වන කාල සීමාව වන බව මෙයින් ප්‍රකාශ කරමි.

1960 ඇසළ උත් සවය

1960 ජූලි 23 වන දින සිට 1960 අගෝස් තු 9 වන දින දක් වා (දෙ දිනම ඇතුළුව)

ටී. සිවඥනම්,
හම්බන් තොට වැඩබලන දිසාපති.

1960 ජූනි 22 දින,
හම්බන් තොට කච්චේරියේ දීය.

## දැන් වීමයි

මාතර දිස් ත්‍රික් කය තුළ දෙනියායේ සහ අකුරැස් සේ පිහිටි තානායම් දෙක වර්ෂ 1960 ජූලි මස 19 වැනි සහ 20 වැනි දෙදිනට මහජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘත නොකෙරෙනවා ඇත.

ඒ. අයි. මොහිදීන්,
මාතර දිස් ත්‍රික් කයේ ආණ් ඩුවේ ඒජන් ත.

කච්චේරිය,
මාතර, 25 ජූනි 1960.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින සිට** අය කරන ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම **ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය** පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් **පත්‍රය** පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ, රජයේ මුද්‍රණාලයේ** මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ **එවිය යුතුයි. (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. **දායක මුදල් :—**

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. **මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.